(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 23.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2020 නොවැම්බර් 13 සිකුරාදා පූ.භා. 10.00 ට**

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම**

1.

අධිකරණ අමාත්‍යතුමා,— දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන),— (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 සහ නොවැම්බර් 12 දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ. භා. 1.00 දක්වා විය යුතු ය. පූ.භා. 10.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 1.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1),— “විසර්ජන පනත් කෙටුම්පත (2021)” සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(1) හි සඳහන් “විසි හය” යන වචන වෙනුවට “විසි එක” යන වචන ආදේශ කිරීමෙන් ක්‍රියාත්මක විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2),— 2020 නොවැම්බර් 18 බදාදා, 19 බ්‍රහස්පතින්දා, 20 සිකුරාදා සහ 21 සෙනසුරාදා “විසර්ජන පනත් කෙටුම්පත (2021)” සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන පනත් කෙටුම්පත (2021)” සලකා බැලීම සඳහා 2020 නොවැම්බර් 18 දින සිට 2020 නොවැම්බර් 20 දින දක්වා වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ. භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 5.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2021)" සලකා බැලීම සඳහා 2020 නොවැම්බර් 21 සෙනසුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.00 දක්වා ද විය යුතු ය. අ. භා. 5.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2020 නොවැම්බර් 17 අඟහරුවාදා අ. භා. 1.40 වන තෙක් කල් තැබිය යුතු ය.

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

* 1.

විසර්ජන (2021) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 2.

සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 3.

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

කර්මාන්තශාලා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***